# වාර්ෂික වාර්තාව 2015

සංචාරක සංවර්ධන අරමුදල



# සංචාරක සංවර්ධන අරමුදල
# වාර්ෂික වාර්තාව - 2015

Invest in Sri Lanka

Sri Lanka Tourism
Development Fund

**2016 අගෝස්තු 30 වන දින**

**ගරු ජෝන් අමරතුංග මහතා,**
**සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා**

**ගරු අමාත්‍යතුමනි,**

යොමුව: සංචාරක සංවර්ධන අරමුදල
2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (1) වගන්තිය යටතේ පිහිටුවා ඇති සංචාරක සංවර්ධන බද්දේ මූල්‍යමය සම්පත් සංචාරක කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා යොදා ගත යුතු බව ඔබගේ කාරුණික අවධානයට ලක් කිරීමට කැමැත්තෙමි. මෙම අරමුදලට මුදල් සපයා ගැනීම මෙන්ම ඒවා බෙදාහැරීම එකී 2005 අංක 38 දරණ සංචාරක පනත මගින් තීරණය කෙරේ.

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (2) වන වගන්තියට අනුව, සිවිල් ගුවන්සේවා අධිකාරිය සංචාරක පිටවුම් බද්දෙන් තුනෙන් එකක ප්‍රමාණයක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ලබා දේ. තවද, සංචාරක ක්ෂේත්‍රයේ නිරත සමාගම් විසින් සංචාරක සංවර්ධන බදු ලෙස කාර්තුමය පදනම මත උක්ත අරමුදල වෙත මුදල් ගෙවනු ලැබේ.

2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලසීමාව තුල සංචාරක සංවර්ධන බද්දේ මුළු මුදල රු. මිලි. 2994.15 ක් වන අතර, එය 2014 වසරේ දී රු. මිලි. 2837.43 ක් විය.
2005 වසර තුලදී උක්ත අරමුදලට ලැබූ හා එය විසින් ලබා දුන් මුදල් පිළිබඳ විස්තර මෙම වාර්තාවේ අඩංගු වේ.

**ස්තුතියි.**

**ඔබගේ විශ්වාසී,**

**අත්. කළේ**
**පී.එම්. විතාන**
**සභාපති**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

පටුන


| | පිටු අං. |
|---|---|
| හැඳින්වීම | 01 |
| මූල්‍ය තත්ව ප්‍රකාශය | 02 |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 03 |
| අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය | 04 |
| ගිණුම් සටහන් | 05-08 |

# හැඳින්වීම

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (1) වගන්තිය යටතේ ස්ථාපිත ඇති සංචාරක සංවර්ධන අරමුදල සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම 2005 අංක 38 දරණ සංචාරක පනතේ අංක 23 (1) වගන්තිය යටතේ ස්ථාපිත කර ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් මෙම අරමුදල පාලනය කිරීම හා මෙහෙයවීම සිදු කෙරේ.

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (2) වගන්තියට අනුව, සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් 2003 අංක 25 දරණ මූල්‍ය පනතේ 2 වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන අරමුදලට ගෙවන අපගමන බද්දෙන් තුනෙන් එකක් ලබා දේ.

තවද, අරමුදලට ලැබෙන මුදල් 2003 අංක 23 දරණ මුදල් පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සියළුම ලියාපදිංචි සංචාරක ආයතන වලින් සංචාරක සංවර්ධන බද්දක් පනවා, රැස් කිරීම සිදු කරයි.

2005 අංක 38 දරණ සංචාරක පනතේ 24 (8) වගන්තියට අනුව, අරමුදලට බැර වන මුදල් සියල්ලම පහත පරිදි බෙදා හරිනු ඇත.

a. 2005 අංක 38 දරණ සංචාරක පනතේ වගන්තිය යටතේ 70 % ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සඳහා

b. 2005 අංක 38 දරණ සංචාරක පනතේ වගන්තිය යටතේ 12% ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සඳහා

c. 2005 අංක 38 දරණ සංචාරක පනතේ වගන්තිය යටතේ 14% ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සඳහා

d. 2005 අංක 38 දරණ සංචාරක පනතේ වගන්තිය යටතේ 4% ක මුදලක් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සඳහා

2015 වසර තුලදී සංචාරක සංවර්ධන අරමුදලින් ලත් මුදල් හා ලබා දුන් මුදල් පිළිබඳ විස්තර මෙම වාර්තාවේ අන්තර්ගත වේ.

සංචාරක සංවර්ධන අරමුදල
මූල්‍ය තත්ව ප්‍රකාශය
2015 දෙසැම්බර් 31 දිනට

| | සටහන් අංකය | 2015 රු. | 2014 රු. |
|---|---|---|---|
| ජංගම වත්කම් | | | |
| මුදල් සහ මුදල් වලට සමාන අයිතමයන් | | 429,136,130.74 | 251,099,525.02 |
| ලැබිය යුතු දෑ | 8 | 670,836,597.93 | 673,329,739.00 |
| **මුළු වත්කම්** | | **1,099,972,728.67** | **924,429,264.02** |
| ජංගම බැරකම් | | | |
| ගෙවිය යුතු දෑ | 9 | 3,186,569.53 | 3,380,858.23 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | | 153,550,062.27 | 128,946,776.81 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | | 767,750,311.48 | 644,733,884.06 |
| ශ්‍රී ලංකා හෝටල් කළමනාකරණ ආයතනය | | 131,614,339.11 | 110,525,808.69 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | | 43,871,446.28 | 36,841,936.23 |
| **මුළු බැරකමත** | | **1,099,972,728.67** | **924,429,264.02** |

පිටු අංක 05 සි 08 දක්වා ඇති ගිණුම්කරන ප්‍රතිපත්ති හා සටහන් යනු මෙම මූල්‍ය ප්‍රකාශන වලට අයත් කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඒ වෙනුවෙන් අත්සන් කර ඇත.

මල්රාජ් බී කිරිඇල්ල
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

පී.එන්. දිසානායක
අධ්‍යක්ෂ/මූල්‍ය කළමනාකරණ
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

පී.එම්. විතාන
සභාපති
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

# සංචාරක සංවර්ධන අරමුදල
## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය
## 2015 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා

| | සටහන අං. | 2015 රු: | 2014 රු:. |
|---|---|---|---|
| ආදායම් | | | |
| බදු | 3 | 2,983,314,283.87 | 2,785,332,979.95 |
| වෙනත් ආදායම් | 4 | 10,839,483.91 | 52,099,002.02 |
| මුළු ආදායම | | **2,994,153,767.78** | **2,837,431,981.97** |
| වියදම් | | | |
| අරමුදල් පරිපාලන පිරිවැය | 5 | 5,402,967.77 | 5,182,686.97 |
| මූල්‍යමය පිරිවැය | 6 | 33,010.00 | 26,922.96 |
| අරමුදල් ලබාදීම් | 7 | 2,988,717,790.01 | 2,832,222,372.04 |
| **මුළු වියදම** | | **2,994,153,767.78** | **2,837,431,981.97** |
| කාලය තුල අතිරික්තය/ (හිඟය) | | - | - |

# සංචාරක සංවර්ධන අරමුදල
## 2015 දෙසැම්බර් 31 දිනට - අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| **අරමුදල් ප්‍රවාහ - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්** | | |
| ආදායම් | | |
| බදු අයකිරීම් | **2,999,568,742.08** | **2,766,453,590.82** |
| වෙනත් ආදායම් | - | 40,000,404.00 |
| ගෙවීම් | | |
| ණයගැතියන්ට ගෙවනලද | (2,818,764,956.85) | (3,370,720,222.26) |
| වෙනත් ගෙවීම් | (2,767,179.51) | (7,523,347.26) |
| ශුද්ධ අරමුදල් ප්‍රවාහ - මෙහෙයුම් ක්‍රියාකාරකම් ත | **178,036,605.72** | **(571,789,574.70)** |
| **මූල්‍ය ප්‍රවාහ - ආයෝජන ක්‍රියාකාරකම් වලින්** | | |
| පිරියත හා උපකරණ මිලදී ගැනීම | - | - |
| පිරියත හා උපකරණ අලෙවියෙන් ලත් මුදල | - | - |
| ශුද්ධ මූල්‍ය ප්‍රවාහ - ආයෝජන ක්‍රියාකාරකම් වලින් | **-** | **-** |
| **මූල්‍ය ප්‍රවාහ - මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ත** | | |
| ණයගැනීම් වලින් ලත් මුදල | - | - |
| ණය පියවීම් | - | - |
| රජයට ලබා දුන් / ලාභාංශ | - | - |
| ශුද්ධ මූල්‍ය ප්‍රවාහ - මූල්‍ය ක්‍රියාකාරකම් වලින් | **-** | **-** |
| ශුද්ධ වැඩිවීම / (අඩුවීම) - මුදල් හා මුදල් වලට සමාන දෑ | **178,036,605.72** | **(571,789,574.70)** |
| මුදල් හා මුදල් වලට සමාන දෑ - කාලසීමාව ආරම්භයේ | **251,099,525.02** | **822,889,099.72** |
| මුදල් හා මුදල් වලට සමාන දෑ - කාලසීමාව අවසානයේ | **429,136,130.74** | **251,099[illegible]525.02** |

## ගිණුම් සටහන්

**1. සංචාරක සංවර්ධන අරමුදල**

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (1) වගන්තිය යටතේ "සංචාරක සංවර්ධන අරමුදල" පිහිටුවා ඇත. සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම හා ප්‍රවර්ධනය සඳහා මෙම අරමුදල භාවිතා කෙරේ. සංචාරක සංවර්ධන බද්ද රැස් කිරීම හා බෙදා හැරීම 2005 අංක 38 දරණ සංචාරක පනතේ හා 2003 අංක 28 දරණ මූල්‍ය ප්‍රකාරව සිදු කෙරේ.

**2. ගිණුම් අවශ්‍යතා**

අරමුදලේ ගිණුම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති වලට අනුකූලව සකසා ඇත.

**3. බදු - අරමුදල් ප්‍රභව**

| | 2015 රු. | 2015 රු. |
|---|---:|---:|
| අපගමන බද්ද | 1,968,541,098.67 | 1,779,766,146.71 |
| සංචාරක සංවර්ධන බද්ද | 1,014,773,185.20 | 1,005,566,833.24 |
| එකතුව | **2,983,314,283.87** | **2,785,332,979.95** |

**3.1 අපගමන බදු**

සංචාරක පනතේ 23 (2) (අ) වන වගන්තියට අනුව, අපගමන බද්දෙන් තුනෙන් එකක ප්‍රමාණයක් සිවිල් ගුවන්සේවා අධිකාරිය මගින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවා ඇත.

| අපගමන බදු [EL] | රු. |
|---|---:|
| ලත් මුදල - 2015 ජන. ඔක් දක්වා | 1,631,276,206.74 |
| ලැබීමට නියමිත මුදල - 2015 නොවැ. - දෙසැ. දක්වා (ප්‍රතිපාදන) | 337,264,891.93 |
| මුළු අපගමන බද්ද - 2015 වසර සඳහා | **1,968,541,098.67** |

**3.2 සංචාරක සංවර්ධන බදු**

2003 අංක 28 දරණ මුදල් පනතට අනුව, සෑම සංචාරක ආයතනයක්ම සංචාරක සංවර්ධන බද්දක් ගෙවිය යුතුවේ. මෙම සංචාරක සංවර්ධන බදු මුදල් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් එකතු කර සංචාරක සංවර්ධන අරමුදලට බැර කෙරේ. 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල තුලදී, සංචාරක සංවර්ධන බදු ලෙස රු. මිලි. 737 ක් ලබා ඇත. තවද, 2015 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා රු. මිලි. 333 ක් ඇස්තමේන්තු කර ඇත. මීට අමතරව, වසර තුල ලත් තථ්‍ය ලැබීම් භාවිතා කරමින් මෙම මුදල් ප්‍රමාණය 2014 ඔක්තෝබර් - දෙසැම්බර් සඳහා වූ සංචාරක සංවර්ධන බදු වෙනුවෙන් පුරෝකථනය කර ඇත.

| සංචාරක සංවර්ධන බදු [TDL] | රු. |
|---|---:|
| ලත් මුදල - 2015 ජන. - දෙසැ. දක්වා | 737,301,503.18 |
| ලැබීමට නියමිත මුදල් - 2015 ඔක්. සැප්. (ප්‍රතිපාදන) | 333,181,941.93 |
| ගැලපුම්කළ අධිප්‍රතිපාදන - 2013 ) 2014 වසර සඳහා | (54,406,579.28) |
| සංචාරක සංවර්ධන බදු තැන්පත | (1,303,680.63) |
| **මුළු සංචාරක සංවර්ධන බදු මුදල - 2015 ජන. සිට දෙසැ. දක්වා** | **1,014,773,185.20** |

**4. වෙනත් ආදායම්**

මුදල් පනතට අනුව අදාළ බදු කාලසීමාවේ සංචාරක සංවර්ධන බදු නොගෙවන ලද ලියාපදිංචි ආයතන වලින් අය කිරීම පැහැර හැර ඇති පොලී වලින් ප්‍රධාන වශයෙන් වෙනත් ආදායම් සමන්විත වේ.

| | 2015 රු: | 2014 රු: |
|---|---|---|
| පැහැරහැර ඇති පොලිය - වසරේ එකතුවූ | 10,831,367.06 | 12,045,561.02 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයෙන් ලත් වැඩිපුර මුදල් | - | 40,000,000.00 |
| ලැබීමට ඇති යෙදවුම් වැට් ගෙවූ - 2012 ) 2013 විගණනය සඳහා | 7,636.85 | - |
| ආපසු නොගත තැන්පත් | - | 53,037.00 |
| අතිරේක මුද්දර ගාස්තුව | 480.00 | 404.00 |
| **එකතුව** | **10,839,483.91** | **52,099,002.02** |

**5. අරමුදල් පරිපාලන පිරිවැය**

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| මුද්දර ගාස්තු | 68,950.00 | 65,525.00 |
| පරිපාලන වියදම් | 5,128,022.77 | 5,088,061.98 |
| විගණන ගාස්තු | 205,995.00 | 29,100.00 |
| **එකතුව** | **5,402,967.77** | **5,182,686.98** |

**6. මූල්‍ය පිරිවැය**

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| බැංකු ගාස්තු | 33,010.00 | 26,922.96 |
| **එකතුව** | 33,010.00 | 26,922.96 |

**7. අරමුදල් බෙදා හැරීම්**

2005 අංක 38 දරණ සංචාරක පනතේ 24 (8) වගන්තිය ප්‍රකාරව මුදල් ලබා දීම සිදු කර ඇත.

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 418,420,490.60 | 396,511,132.09 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය් | 2,092,102,453.07 | 1,982,555,660.43 |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | 358,646,134.74 | 339,866,684.64 |
| **ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය** | **119,548,711.60** | **113,288,894.88** |
| **එකතුව** | **2,988,717,790.01** | **2,832,222,372.04** |

**8. ලැබිය යුතු මුදල්**

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| ලැබීමට නියමිත තොටුපල බදු | 337,264,891.93 | 285,417,854.56 |
| ලැබීමට නියමිත TDL | 333,181,941.93 | 387,588,521.21 |
| ණයගැතියෝ | 382,127.22 | 323,363.23 |
| විගණනය සඳහා ගෙවූ ලැබීමට ඇති යෙදවුම් වැට් | 7,636.85 | - |
| **එකතුව** | **670,836,597.93** | **673,329,739.00** |

9. ගෙවිය යුතු මුදල්

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| උපචිත වියදම් - පරිපාලන ගාස්තු | 3,045,774.53 | 3,022,527.95 |
| උපචිත වියදම් - විගණන ගාස්තු | 117,345.00 | 58,200.00 |
| උපචිත වියදම් - මුද්දර බදු | 23,450.00 | 65,525.00 |
| වෙනත් ජංගම බැරකම් | | - |
| **එකතුව** | **-** | **234,605.28** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීඅයිපී/ඒ /ටීඩීඑෆ්/1/15/01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 අගෝස්තු 10 දින

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.**

---

සංචාරක සංවර්ධන අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම.

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන.

-----------------

2.1 මතය

---------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සංචාරක සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව අස්තිත්වයක් විසින් ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේදවලදී සිදු වී ඇති වැරදි සොයා ගැනීමෙන් පසුව නිකුත් කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහිම අතීතානුයෝගීව නිවැරදි කිරීම් සිදුකළ යුතු වුවත් ඉකුත් වර්ෂ 2 ට අදාල සංචාරක සංවර්ධන බදු අයි ප්‍රතිපාදන රු.54,406,579 ක් අතීතානුයෝගීව නැවත ප්‍රකාශ කිරීම් ලෙස ගිණුම්ගත කිරීම් වෙනුවට සමාලෝචිත වර්ෂයේදී ආදායමින් අඩුකර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ | |
| i. 24 (3) වගන්තිය | සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා රීති සාදා නොතිබුණි. |
| ii. 24 (8) වගන්තිය | සංචාරක සංවර්ධන අරමුදලේ බැරට ඇති සියළු මුදල් අදාල ආයතන වෙත බෙදා හැරිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අරමුදලේ බැරට රු.429,136,130 ක මුදලක් පැවතියද එම මුදල් බෙදාහැරීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2003 අංක 25 දරන මුදල් පනතේ 2 (ආ) උප වගන්තිය | ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන නැවකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මගියෙකු සඳහා නිකුත් කරන සෑම ටිකට් පතකින්ම බදු අයකර ඉන් කොටසක් අධිකාරිය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් එලෙස නැව් මගින් ගමන්කරන මගීන්ගෙන් බදු අයකර අධිකාරිය වෙත එවා නොතිබුණු අතර නැව් මගින් ගමන් ගන්නා මගීන්ගෙන් අයවීම් නොමැති බවට සනාථ කිරීමද ලබාගෙන නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි අංක 169(2) | චෙක්පත් උපලබ්ධි වීමට පෙර ආයතනය සේවා සපයා තිබූ චෙක්පත් 07කට අදාළ රු.143,504ක මුදලක් අයකර ගැනීමට නොහැකිව තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ආදායම රු. 2,994,153,768 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම රු. 2,837,431,982 ක් වූයෙන් ආදායමෙහි රු. 156,721,786 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. අපගමන බදු ආදායම වැඩි වී තිබීම ආදායමේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. කෙසේ වුවද අනෙකුත් ආදායම් ඉකුත් වර්ෂයට වඩා රු. 41,259,518 කින් අඩුවී තිබුණි. ඒ අනුව අරමුදලේ පසුගිය වර්ෂ 05 ක සමස්ථ ආදායම අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

2003 අංක 25 දරන මුදල් පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව එකතු කරන අපගමන බදු මුදලින් 1/3 හා 2005 අංක 38 දරන සංචාරක කටයුතු පිළිබඳ පනත යටතේ ඇති සංචාරක සංවර්ධන බදු අරමුදලේ ආදායම වන අතර එම මුදල සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධනය හෝ සංවර්ධනය උදෙසා දරන ලද වියදම් වෙනුවෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය,ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය,ශ්‍රී ලකා සංචාරක සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය වෙත ලද මුදලින් පිළිවෙලින් සියයට 70,12,14, සහ 4 බැගින් ලබා දීමට පනතින් ප්‍රතිපාදන සලසා තිබුණි.

සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල විසින් දරන ලද රු.5,402,968 වියදම් කිරීමෙන් අනතුරුව ඉතිරි මුදල් යථෝක්ත ආයතන වෙත පිළිවෙලින් රු.2,092,102,453, රු.358,646,135 රු.418,420,491 හා රු.119,548,712 ක් ලබා දී තිබුණි. මෙම මුදල් අදාල ආයතන විසින් යථෝක්ත අරමුණු සඳහා යෙදවූයේද යන්න පසුවිපරම් කිරීම සඳහා ක්‍රමවේදයක් අරමුදල විසින් සකසා නොතිබුණි.

4.2. කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල් මගින් පරිපාලන වියදම් ලෙස රු. 5,128,023 ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. එසේ වුවත්, පරිපාලන වියදම් ගෙවීමට 2005 අංක 38 දරන සංචාරක පනතේ විධිවිධාන සලසා නොතිබුණි.

(ආ) 2003 අංක 25 දරන මුදල් පනතේ විධිවිධාන අනුව 2003 අගෝස්තු 29 දිනැති අංක 1303/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව අපගමන බද්ද ගුවන් මගින් පිටවන සෑම තැනැත්තෙකුගෙන්ම එක්සත් ජනපද ඩොලර් 15 ක්ද, නැවකින් පිටත්වන සෑම තැනැත්තෙකුගෙන්ම එක්සත් ජනපද ඩොලර් 2.5 ක් අය කළ යුතු වුවද, මෙම අපගමන බද්ද අය කරන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2004 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා විනිමය අනුපාතිකයේ වෙනස්කම් සිදු වී තිබුණද එක්සත්

ජනපද ඩොලර් එකකට රු 100 ක විනිමය හුවමාරු අනුපාතයක් පදනම් කරගෙන මෙම බද්ද අය කර තිබීමෙන් මෙම කාලපරිච්ඡේදය තුලදී ආසන්න වශයෙන් රු.300,000,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ) සංචාරක සංවර්ධන බදු අයකර ගත යුතු ආයතන පිළිබඳව දත්ත සමුදායක් සකස් කර නොතිබුණි. තවද ඒ ඒ වර්ෂවල අය කළ බද්ද හා ආයතනවල විකුණුම් ආදායම ලේඛනගත කර නොතිබූ හෙයින් හිඟ බදු පිළිබඳව නියාමනයක් සිදු වී නොතිබුණි.

(ඇ) 2003 දෙසැම්බර් 11 දිනැති අංක 1318/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රයේ 1 හා 4 ඡේදයන්හි නියෝග ප්‍රකාර සංචාරක බදු මුදල් නියමිත කාල පරිච්ඡේදය තුළ නොගෙවන්නන්ගෙන් පනවන ලද දඩ මුදල් ප්‍රමාණවත් නොවීම නිසා සංචාරක බදු මුදල් ගෙවීම උනන්දු කරවීමට බලපා නොතිබුණි.

(ඉ) 2003 අංක 25 දරන මුදල් පනතේ 4(2) වගන්තිය ප්‍රකාර ගුවන් සමාගම් විසින් නියමිත කාලය තුළ බදු නොගෙවන අවස්ථාවලදී අදාල දඩ පොලී සමග එකී මුදල් අයකර අධිකාරිය වෙත ප්‍රේෂණය කරන්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය.

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත අවසන් ගිණුම් ඉදිරිපත් කළයුතු වුවත් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2016 මාර්තු 28 දිනය.

5.2 අභ්‍යන්තර විගණනය

අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන් 2 වූ අපගමන බදු ආදායම හා සංචාරක සංවර්ධන බදු ආදායම් රැස් කිරීම, හිඟ බදු ආදායම ගණනය කිරීම, බදු ආදායම ගිණුම් තැබීම හා බදු අයකිරීමේ පද්ධති පාලන දූර්වලතා හඳුනා ගැනීමට අභ්‍යන්තර විගණන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

5.3 අයවැය ලේඛනමය පාලනය.

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්, වියදම් අතර විෂයයන් 05 ක් සම්බන්ධයෙන් සියයට 7 සිට සියයට 59 දක්වා සැලකිය යුතු විචලන නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. ආදායම් රැස්කිරීමේ පාලනයන් සම්බන්ධයෙන් සංචාරක සංවර්ධන බදු හා අපගමන බදු ආදායම් නිශ්චිතව හඳුනාගැනීම හා එහි නිවැරදිතාවය තහවුරුකර ගැනීමට අදාල ක්‍රමවේදයක් සකස්කිරීම පිළිබඳ විශේෂ අවධානය යොමුවිය යුතුය.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

